# ඌව පළාත් සභාව

ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්‍ෂක,
වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය.

## 2024 වසර සඳහා

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්‍ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශයේ 2024 වසර සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති දේශීය ආයතන වලින් හා පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **අයදුම්පතෙහි සඳහන් එක් එක්** අංකය යටතේ **ඇති අයිතම** කාණ්ඩය **සඳහා** ආපසු නොගෙවන රු. 500/- ක මුදලක් **(එක් කාණ්ඩයකට රු. 500 බැගින්)** අයකරනු ලබන අතර අදාළ ආකෘති පත්‍ර https://healthmin.up.gov.lk යන වෙබ් අඩවිය මගින් හෝ **ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්‍ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ගණකාධිකාරී වෙතින්** හෝ අයදුම්පතෙහි සඳහන් අයිතමයන් විද්‍යුත් තැපැල මගින් ලබා ගැනීම සඳහා hminuvapacc@gmail.com යන විද්‍යුත් ලිපිනයට **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2024** අයිතමයන් ලබා ගැනීම ලෙස සඳහන් කොට **e-mail එවීම මගින් හෝ ලබා ගත හැක. ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ගෙනවිත් භාරදීමේදී හෝ වෙබ් අඩවිය මගින් ලබාගත් අයදුම්පත් සම්පූර්ණ කර අප වෙත යොමු කිරීමේදී ලේකම්. සෞඛ්‍ය අමාත්‍යාංශය නමින් ඇති ගිණුම් අංක 269100198440347 මහජන බැංකුව මුතියංගණ ශාඛාව වෙත මුදල් බැරකරන ලද රිසිට්පතෙහි මුල් පිටපත අප වෙත යොමුකිරීම හෝ කාර්යාලයට පැමිණ මුදල් ගෙවීම සිදුකළ හැක.** අයදුම්පත් ලබා ගැනීම සඳහා **තැපෑලෙන් එවන චෙක්පත්, මුදල් ඇණවුම් හා මුදල් භාර ගනු නොලැබේ.**

අපේක්‍ෂිත අයදුම්කරුවන් තමන් සැපයීමට බලාපොරොත්තු වන භාණ්ඩ හා සේවා විස්තර අයදුම්පත්වල පැහැදිලිව සඳහන් කළ යුතු අතර, සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වන සියළුම අයදුම්කරුවන් ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ හෝ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් **අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.**

අදාළ අයදුම්පත් 2023.10.11 සිට 2023.11.15 දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාලයෙන් නිකුත් කරනු ලබන අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2023.11.15 දින ප.ව. 3.30 ට පෙර **, සභාපති, ප්‍රසම්පාදන කමිටුව, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්‍ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය, ආර්.එච්. ගුණවර්ධන මාවත, බදුල්ල,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ යුතුය.** අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024,** යනුවෙන් සඳහන් කළ යුතුය.

සියළුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්‍ෂා කර බැලීමෙන් පසු ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පිළිබඳ අවසාන තීරණය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සතුය.

අමාත්‍යාංශ ලේකම්/ප්‍රසම්පාදන කමිටු සභාපති
**ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා**
**ළමාරක්‍ෂක, වනිතා කටයුතු, සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය,**
**ආර්.එච්. ගුණවර්ධන මාවත,**
**බදුල්ල.**
2023.10.11